# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව

## 1994 අංක 4 දරණ දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය

දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය
(සටහන් කළේ 1994 දෙසැම්බර් මස 02 දින)

දකුණු පළාතේ පළාත් සභාවේ නියමය පරිදි
මුද්‍රණය කරන ලදී.

දකුණු පළාතේ පළාත් ආදායම් කොමසාරිස් කාර්යාලයෙන්
මිළදී ගත හැක.

ගාල්ලේ ආරියදාස මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දකුණු පළාතේ පළාත් සභාව

1994 අංක 4 දරණ දකුණු පළාත් සභාවේ
මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය.

මෙම ප්‍රඥප්තිය 1994 නොවැම්බර් මස 30 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී සභා සම්මත වූ බව සහතික කරමි.

සභාපති
දකුණු පළාත් සභාව

**1990 අංක: 07 දරණ දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තිය යටතේ එකතු කරන ලද මුද්දර ගාස්තු දකුණු පළාතේ පළාත් පාලන ආයතනවලට හැරවීම සඳහා**

# විධිවිධාන සැලැස්වීම පිණිස ප්‍රඥප්තියකි.

දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කරනු ලැබේ.

ලුහුඬු නාමය

1 මේ ප්‍රඥප්තිය 1994 අංක. 04 දරණ දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

මුද්දර ගාස්තු හැරවීම.

2 1990 අංක. 07 දරණ දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය සහ 1992 අංක 02 දරණ දකුණු පළාත් මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර, පළාත් සභාව විසින් දකුණු පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලනය සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අයකර, එකතුකර දකුණු පළාතේ පළාත් සභා අරමුදලට ගෙවා ඇති අවස්ථාවක පළාත් සභාව විසින් ඒ මුද්දර ගාස්තුව අයකර එකතු කරනු ලැබුවේ යම් නිශ්චල දේපළක් පැවරීම සම්බන්ධයෙන් ද, ඒ නිශ්චල දේපළ පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවන් ඇතුළත ද, ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන නිලධාරියා විසින් ඉහත කී පරිදි ඒ මුද්දර ගාස්තුව අය කර, එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින සිට අවුරුදු 02 ක් වූ කාල සීමාවක් ඇතුළත, දකුණු පළාතේ පළාත් අමාත්‍ය මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා වෙත, ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන ලද විට, පළාත් සභාව විසින් ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුවේ මුදල හැරවිය හැකිය.

"මෙම වගන්තියේ කාල සීමාව පිළිබඳව සඳහන් නියමයන්, මෙම ප්‍රඥප්තිය සම්මත වීමට පෙර, වර්ෂයන්ට බල නොපැවැත්විය යුතුය."

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ සහතිකය.

3 2 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද සියලු හිමිකමක්, ඒ හිමිකමෙහි සඳහන් කරන ලද මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඔහු වෙනුවෙන් නම් කරන ලද වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරන ලද දකුණු පළාත් සභාව විසින් නියම කරන ආකාරයක, උපලේඛණයක් ඒ හිමිකම සමඟ ඉදිරිපත් කරනු නොලැබුවහොත්, වලංගු නොවන්නේය.

4 මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය කළහොත් මිස "ප්‍රධාන පරිපාලන නිලධාරියා" යන්න—

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට ඉන් එහි නාගරික කොමසාරිස්වරයා සහ

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් යෙදෙනවිට, ඉන් එහි ලේකම්වරයා අදහස් වේ.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක් නගර සභාවක් හෝ ප්‍රා. සභාවක් අදහස් වන අතර, එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන බලතල වලට සහ කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල කාර්‍ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා පිහිටුවනු ලබන වෙනත් යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ.

"සාධන පත්‍රය" යන්නෙහි 1990 අංක: 0 දරණ දකුණු පළාතේ මුදල් ප්‍රඥප්තියේ ඇති අර්ථයම ඇත්තේය.

''පළාත් සභාව'' යන්නෙන්, ශ්‍රී ලංකා ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවයන් ඇති වූ විට, සිංහල පාඨය බල පැවැත්විය යුතු බව.

5 මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, අනනුකූලතාවයක් ඇති වූ විටක, සිංහල භාෂා පාඨය බල පවත්නේය.

දකුණු පළාත් සභාව මගින් සම්මත කරන ලද මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154 එච්. වගන්තිය ප්‍රකාර දකුණු පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 1994. 12. 02 දින අනුමත කර ඇත.

දකුණු පළාත් සභාව මගින් නියම කරන ආකෘති පත්‍රය (තුන්වන වගන්තිය යටතේ)

ඉඩම රෙජිස්ට්‍රාර් කාර්යාලය........................................

1994 අංක 04 දරණ දකුණු පළාත් සභාවේ මුද්දර ගාස්තු මාරු කිරීමේ ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ උපලේඛණය වර්ෂ..........19.........ක්වූ..................මාසය තුළ..................ම. හ. සභා / නගර සභා / ප්‍රා / සභා බල ප්‍රදේශය තුළ පවරන ලද දේපළ වලට අදාල මුද්දර ගාස්තු සම්බන්ධ විස්තර

| 1<br>අනුක්‍රමික අංකය | 2<br>නොතාරිස්ගේ නම | 3<br>ඔප්පු අංකය | 4<br>ඔප්පුවේ දිනය | 5<br>ඔප්පුවේ ස්වභාවය | 6<br>මුද්දර ගාස්තුව | 7<br>අලවා ඇති මුද්දර/ සහතික වර්ගය | 8<br>වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

( I ) මධ්‍යම රජයේ මුද්දර අලවා තිබේනම් "මධ්‍යම රජය" යනුවෙන්ද, පළාත් සභාවකට අයත් මුද්දර හෝ සහතික අලවා තිබේනම්, එම "පළාත් සභාවේ නම" ද ඉහත 7 වෙනි තීරුව යටතේ සඳහන් කළ යුතුය. (කුමන පළාත් සභාවකට අයත් මුද්දර ද යන්න ගැන විශේෂයෙන් සැළකිළිමත් විය යුතුය.)

( II ) යම් හෙයකින් බදු ඔප්පු සහ උගස් ඔප්පු සඳහා වැරදීමකින් පළාත් සභා මුද්දර/සහතික අලවා තිබේනම්, ඒවා සියල්ල ද මෙම ලේඛණයට ඇතුළත් කළ යුතුය.

(III) මුද්දර ගාස්තුව තීරුව (6) යටතේ ඔප්පුවේ මුල් පිටපතට අලවා ඇති රු. 1/- ගාස්තුව ද ඇතුළත් කර තිබේනම්, ඒ බව වෙනත් කරුණු යටතේ සඳහන් කළ යුතුය.

සකස් කලේ (නම).............................................. අත්සන..........................................

මෙහි ඉහත දක්වෙනුයේ ........................................ මහ නගර සභාව/නගර සභාව ප්‍රාදේශීය සභාව වෙනුවෙන් 19 ........................................ ආයය සඳහා පිළියෙල කරන ලද සත්‍යවූත්, නිවැරදි වූත්, සම්පූර්ණවූත්, මුද්දර ගාස්තු රුපියල් ........................................ ශත ............ (රු. ........................................) ප්‍රකාශයක් බවත්, ලේඛණ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (117 වැනි අධිකාරය) 5 (1) යන වගන්තිය අනුව මෙම කාර්යාලයේ ගොනුකර ඇති ඔප්පු පිටපත් ඇසුරින් එය පිළියෙල කරන ලද බවත්, එකම නොතාරිස් වරයාට අයත් ඔප්පුව මෙම උප-ලේඛණවල දෙවරක් ඇතුළත්ව නොමැති බවත්, එසේම පළාත් පාලන ආයතන දෙකක් යටතේ ඇතුළත්ව නොමැති බවත්, ඉහත උප ලේඛණයේ 7 වැනි තීරයේ දක්වා ඇති පරිදි දකුණු පළාත් සභා මුද්දර/බැංකු තැන්පත් කිරීම මගින් ගාස්තු අය වී ඇති බවටත් ........................................ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රිජිස්ට්‍රාර් ........................................ වන මම මින් සහතික කරමි.

........................................

අත්සන

නම ........................................

මුද්‍රාව:-

දිනය:-

කාර්යාලීය
දින මුද්‍රාව.

පිටපත:- මහ නගර සභාව/නගර සභාව/ප්‍රාදේශීය සභාවේ නගරාධිපති / සභාපතිගේ දැන ගැනීම පිණිස.

කරුණාකර උපලේඛණය පිළියෙල කිරීම සඳහා රිජිස්ට්‍රාර් ජනරාල් නමින් රු ........................................ක චෙක් පතක් මා වෙත නිකුත් කරන්න.

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ප්‍රයෝජනය පිණිසයි

ප්‍රධාන ලේකම්/පළාත් ආදායම් කොමසාරිස්,
දකුණු පළාත.

අනු අත්සන් කොට අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

........................................

රිජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට

දිනය හා මුද්‍රාව,-

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය,
340, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 3.